# පුරප්පාඩු දැන්වීමයි
## අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
## සබරගමුව පළාත් සභාව.

**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර හා රත්නපුර, නිවිතිගල, බලංගොඩ හා දෙහිඕවිට කලාපවල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා තෝරා ගැනීම.**

සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ දැනට පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරින් වෙතින් දීප ව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.

| අ.අං | පුරප්පාඩු තනතුර | අනුමත ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.අ.ප.සේ I | 01 |
| 02 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (දෙහිඕවිට) | ශ්‍රී.ලං.අ.ප.සේ I | 01 |
| 03 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (බලංගොඩ) | ශ්‍රී.ලං.අ.ප.සේ I | 01 |
| 04 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (රත්නපුර) | ශ්‍රී.ලං.අ.ප.සේ I | 01 |
| 05 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (නිවිතිගල) | ශ්‍රී.ලං.අ.ප.සේ I | 01 |

### 01. සුදුසුකම් :-

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.
- අයදුම්කරුවන් පුවත්පත් දැන්වීමේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන **2023.04.28** දිනට පූර්වාසන්න වසර 05 තුළ කිසිදු විනයානුකූල දඬුවමකට යටත් නොවූ අයෙකු විය යුතු අතර, එම වසර 05 තුලදී සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.
- සෑම අයදුම්කරුවෙකුම තම තනතුරේ සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

## 02. තෝරා ගන්නා ක්‍රමවේදය :-

ඉහත අංක 01 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන්, සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකදී අනුමත කරන ලද ලකුණු පටිපාටියකට අනුව ලකුණු පිරිනමා, ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත ඉහළ ලකුණු ලබා ගත් නිලධාරීන් අදාළ තනතුරු සඳහා තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ. (අනුමත ලකුණු පටිපාටිය **www.moe.sg.gov.lk** වෙබ් අඩවියෙහි පළ කර ඇත.)

**සටහන :** සුදුසුකම් සනාථ කරන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

## 03. අයදුම්පත් ඉදිරිපත් කිරීම.

සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර **2023.04.28** වන දින හෝ ඊට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මගින් (සබරගමුව පළාතේ අයදුම්කරුවන් හැර අනෙකුත් පළාත් සභාවලට අන්තර්ග්‍රහණය වූ අයදුම්කරුවන් ඔබගේ අයදුම්පත අදාළ පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ හා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතු වේ.) **"ලේකම්, අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව, නව නගරය, රත්නපුර"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

එසේම තනතුරු කිහිපයකට ඉල්ලුම් කරනු ලබන්නේ නම්, ආදර්ශ අයදුම්පත්‍රයේ අනු අංක 01 යටතේ ඉල්ලුම් කරන තනතුරු ප්‍රමුඛතාවය අනුපිළිවෙලට තනතුරු සඳහන් කල යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ තනතුරු සඳහා නිලධාරීන් තෝරා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාදවීම හෝ නැති වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් සබරගමුව පළාත් අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් භාර ගනු නොලැබේ. (ආදර්ශ අයදුම්පත **www.moe.sg.gov.lk** යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය).

මෙහිදි තනතුරු කිහිපයකට ඉල්ලුම් කල හැකි නමුත්, පවත්වනු ලබන විධිමත් සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලද ලකුණු ද සැලකිල්ලට ගෙන ඉහත තනතුරු සඳහා තේරීපත් වන නිලධාරීන් එම පුරප්පාඩු මත ස්ථානගත කිරීම සම්බන්ධයෙන් අවසන් තීරණය සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සතු වේ.

**මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර, යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්වෙනු ඇත.**

S. Rat

**සුජානි ආර්. විජේතුංග,**
**ලේකම්,**
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
**සබරගමුව පළාත් සභාව.**

**2023.04.03**